# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 161/12 — 1975 මැයි 02 වැනි සිකුරාද — 1975.05.02

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### අයිතිය ඉල්ලීමේ දැන්වීම

1963 අංක 5 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 34 වැනි ඡේදයේ (1) වැනි උප ඡේදය යටතේ කම්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරියෙකු වන ගොඩ්වින් පීරිස් පටුවත විතාන වන මම එකී ඡේදයේ සඳහන් වගීයට සහ විස්තරයට අදාල දේපලක් වන මෙහි උපලේඛනයෙහි සඳහන් දේපල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය බව මෙයින් ප්‍රකාශ කරමි.

ගොඩ්වින් පීරිස් පටුවත විතාන,<br>
උප සභාපති සහ වැඩබලන සාමාන්‍යාධිකාරී තැන,<br>
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

1975. 04. 12 දින,<br>
කොළඹ දී ය.

### උපලේඛනය

1. (1) සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, උඩුව පළාත ගම් සහා සීමාව තුල බුලත්කොහුපිටිය-දේදුගල පාරේ වරිපනම් අංක 50/52 දරණ ගිනිවලපිටිය කියන, උතුරට: එම ඉඩමේම කොටසක්ද; නැගෙනහිරට: බුලත්කොහුපිටිය-දේදුගල පාරද; දකුණට සහ බස්නාහිරට: එම ඉඩමේම කොටසක්ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) වූ සම්පූර්ණ බිම් කොටස.

2. මෙම උපලේඛනයේ අංක 1 හි විස්තර කෙරෙන ඉඩමෙහි පිහිටි හෝ සම්භවන්නා වූ සියළුම චංචල හා නිශ්චල දේපොල.

ප්‍රනිති/සී/208<br>
ලංකා පිරවීම් පොල,<br>
බුලත්කොහුපිටිය.

2. (1) සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ එල්ලාවල ගම්සභා සීමාව තුල කොළඹ-රත්නපුර ප්‍රධාන පාරේ පිහිටි පුස්සැල්ලේ අම්පිටියවත්ත කියන, උතුරට: අම්පිටිය වත්තේ කොටසක්ද; නැගෙනහිරට: අවිස්සාවේල්ල-රත්නපුර ප්‍රධාන පාරද; දකුණට හා බස්නාහිරට: අම්පිටිය වත්තේ කොටසක්ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් දහහතරක් (අ. 0, රූ. 0, පර්. 14) වූ සම්පූර්ණ බිම් කොටස.

2. මෙම උපලේඛනයේ අංක 1 ස් විස්තර කෙරෙන ඉඩමෙහි පිහිටි සහ සම්භවන සියළුම චංචල හා නිශ්චල දේපොල.

නිති/බී/295,<br>
ලංකා පිරවීම් පොල,<br>
පුස්සැල්ල.

3. (1) සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ගම්සභා සීමාව තුල දැරණියගල පිහිටි දැරණියගල-නූරිපාරේ වරිපනම් අංක 62 දරණ හම්බනවිල වත්ත කියන, උතුරට: දැරණියගල-නූරි ප්‍රධාන පාරද; නැගෙනහිරට සහ දකුණට: හම්බනවිල; බස්නාහිරට: හම්බනවිල වත්තේ බස් නැවතුම් පොලද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) වූ සම්පූර්ණ බිම් කොටස.

2. මෙම උපලේඛනයේ අංක 1 හි විස්තර කෙරෙන ඉඩමේ පිහිටි හෝ සම්භවන සියළුම චංචල හා නිශ්චල දේපොල.

නිති/බී/237,<br>
ලංකා පිරවීම් පොල,<br>
දැරණියගල.

4. (1) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ බේරුවල නගර සභාව තුල අංක 1 දරණ කොට්ඨාශයේ බේරුවල පිහිටි ගාලු පාරේ වරිපනම් අංක 173 ඒ ස්ථානයේ කොටසක් වන ඇලෝවිල වත්ත කියන; ඊශාන දිගට කොළඹ-ගාල්ල දුම්රිය පාරද; ගිනිකොණ දිගට ඇලෝවිල වත්ත (කොටසක්) ගාලු පාරේ වරිපනම් අංක 175 දරණ ස්ථානයද; නිරිත දිගට කොළඹ ගාල්ල ප්‍රධාන පාරද සහ වයඹ දිගට ඇලෝවිල වත්ත කියන ඉඩමේ (කොටසක්) ගාලු පාරේ වරිපනම් අංක 173 දරණ ස්ථානයද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් තිස්තුනයි දශම එකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 33.12) වූ සහ බලයලත් මිනින්දෝරු එස්. ඒ. කුලතිලක විසින් සම්පාදනය කරන ලද 1974.2.7 වැනි දිනැති අංක 142 දරණ පිඹුරේ දැක්වෙන සම්පූර්ණ බිම් කොටස.

2. මෙම උපලේඛනයේ අංක 1 හි විස්තර කෙරෙන ඉඩමෙහි පිහිටි සහ සම්භවන සියළුම චංචල හා නිශ්චල දේපොල.

නීති/සී/549,
ලංකා පිරවීම් පොල,
බේරුවල.

5. (1) සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ කිරිඇල්ල ගම්සභා සීමාව තුල රත්නපුර-පානදුර පාරේ කිරිඇල්ලේ හැරනියාවක වත්ත කියන, උතුරට: රත්නපුර-පානදුර ප්‍රධාන පාරද; නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට: හැරනියාවක වත්තේ කොටසක්ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් පහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 5.5) වූ සම්පූර්ණ බිම් කොටස.

2. මෙම උපලේඛනයේ අංක 1 හි විස්තර කෙරෙන ඉඩමේ පිහිටි හෝ සම්භවන සියළුම චංචල හා නිශ්චල දේපොල.

නීති/බී/494,
ලංකා පිරවීම් පොල,
කිරිඇල්ල.

6. (1) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අලුත් කුරුකෝරලේ දකුණු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ රාගම නගර සභාව සීමාව තුල රාගම-ජේරලන්ද කොට්ඨාශයේ පිහිටි මහබාගේ-රාගම පාරේ වරිපනම් අංක 40 (කලින් 303) දරණ පහල ඒදණ්ඩ කුඹුර කියන, උතුරට: එන්. එම්. මැන්ඩිස්ට සහ අනිකුත් අයට අයිති පහල ඒදණ්ඩ කුඹුර කියන ඉඩමේ කොටසක්ද; නැගෙනහිරට: සී. විජේනායකට අයිති එම ඉඩමේම කොටසක්ද; දකුණට: මහබාගේ-රාගම ප්‍රධාන පාරද සහ බස්නාහිරට: මහබාගේ-කඳාන පාරද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් විසිතුනයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 23.5) වූ සම්පූර්ණ බිම් කොටස.

2. මෙම උපලේඛනයේ අංක 1 හි විස්තර කෙරෙන ඉඩමේ පිහිටි හෝ සම්භවන සියළුම චංචල හා නිශ්චල දේපොල.

නීති/බී/82,
ලංකා පිරවීම් පොල,
රාගම.

7. (1) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ, හොරණ ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ රයිගම් උඩුගහපත්තු ගම්සභා සීමාව තුල ඉංගිරිය උතුරේ පිහිටි රත්නපුර පාරේ ඉංගිරියේ පිහිටි වරිපනම් අංක 25 දරණ පුවක්වත්ත කියන, උතුරට: පුවක්වත්ත (කොටසක්ද); නැගෙනහිරට: සුමනසේකර පෙරේරාට හිමි පුවක්වත්ත (කොටසක්ද); දකුණට: රත්නපුර පාරද සහ බස්නාහිරට: ඩී. සී. දෙඩන්ගොඩට හිමි පුවක්වත්ත (කොටසක්ද) මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් විසිදෙකක් (අ. 0, රූ. 0, පර්. 22) වූ සම්පූර්ණ බිම් කොටස.

2. මෙම උපලේඛනයේ අංක 1 හි විස්තර කෙරෙන ඉඩමේ අඩංගු හෝ සම්භවන සියළුම චංචල හා නිශ්චල දේපොල.

නීති/බී/556,
ලංකා පිරවීම් පොල,
ඉංගිරිය.

8. (1) වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි-හත්පත්තුවේ ගිරිල්ලලෙන කෝරළේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ හෙට්ටිපොල ගම්සභා සීමාව තුල හෙට්ටිපොල පිහිටි කුරුණෑගල පාරේ වරිපනම් අංක 347 දරණ උතුරට: කුරුණෑගල පාරේ වරිපනම් අංක 343/1 දරණ ස්ථානයද; නැගෙනහිරට: කුරුණෑගල පාරේ වරිපනම් අංක 351 දරණ ස්ථානයද; දකුණට: හලාවත කුරුණෑගල ප්‍රධාන පාරද සහ බස්නාහිරට: කුරුණෑගල පාරේ වරිපනම් අංක 343 දරණ ස්ථානයද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් එකොළොහයි දශම හතරක් වූ (අ. 0, රූ. 0, පර්. 11.4) සහ බලයලත් මිනින්දෝරු එස්. ඒ. කුලතිලක විසින් සම්පාදනය කරන ලද 1975.01.23 වැනි දිනැති අංක 213 දරණ පිඹුරේ දැක්වෙන සම්පූර්ණ බිම් කොටස.

2. මෙම උපලේඛනයේ අංක 1 හි විස්තර කෙරෙන ඉඩමේ පිහිටි හෝ සම්භවන සියළුම චංචල හෝ නිශ්චල දේපොල.

නීති/සී/334,
ලංකා පිරවීම් පොල,
හෙට්ටිපොල.

5-253

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී